**Nadeesha Hettiarachchi** *B.A.(Colombo)*
*Attorney-at-Law & Notary Public,*
*Registered Company Secretary &*
*Commissioner for Oaths*
*No. 425/ 31,Mahawatta,*
*Kandaliyadda Paluwa,*
*Ganemulla,*
*Sri Lanka.*
*Mobile : 0766547109*

**නදීෂ හෙට්ටිආරච්චි** බී.ඒ (කොළඹ),
නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස්,
සමාගම් ලේකම් සහ දිවුරුම් කොමසාරිස්,
අංක 425/ 31, මහවත්ත,
කැන්දලියද්ද පාළුව,
ගණේමුල්ල,
ශ්‍රී ලංකාව.

*E-mail nadeeshahettiarachchi23@gmail.com*

---

අගති විරහිතයි
--------------------

2024/08/30

ජයසේකර පතිරන්නැහැලාගේ දයාසිරි පත්ම කුමාර,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
නො.9/6,
ඩේවිඩ්සන් කුළුණ,
හැව්ලොක් සිටි,
කොළඹ 05.

## <u>එන්තරවාසියයි</u>

මාගේ සේවා දායක තලවතු ගොඩ, පෙරේරා මාවත, අංක 700/108, ලිපිනයේ පදිංචි නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය, පාර්ලිමේන්තු මන්ත්‍රී, ප්‍රසන්න රණතුංග මහතාගේ උපදෙස් පරිදි ඔබ වෙත ලියා දන්වමි.

වර්ෂ 2024/08/18 දින හෝ ආසන්න දිනකදී මාතර, අකුරැස්ස ප්‍රදේශයේ පැවැති දේශපාලන රැස්වීමකදී හා පසු අවස්ථාවකදී " Iraj show" නැමති යූ ටියුබ් චැනලය ඔස්සේ ඔබ සමග පැවති සම්මුඛ සාකච්ඡාවකදී ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාගේ මැතිවරණ ව්‍යාපාරය සඳහා සහාය දීමට මාගේ සේවා දායක ඇතුළු තවත් මන්ත්‍රීවරු පිරිසක් වෙත සුරාබදු බලපත්‍ර ලබා දී ඇති බවටත්, මාගේ සේවා දායක වෙත ලබා දී ඇති සුරා බදු බලපත්‍රය ගම්පහ මාකේව්ට ප්‍රදේශයේ පදිංචි සුරා බදු නිලධාරියකු නමට නිකුත් කර ඇති බවටත් ඔබ විසින් අසත්‍ය ප්‍රකාශයක් කර ඇති බවට මා වෙත උපදෙස් ලැබී ඇත.

තවද ඔබ විසින් කරන ලද අදාළ අසත්‍යය ප්‍රකාශය හිරු මාධ්‍ය ජාලය ඔස්සේ එදිනම හෝ ආසන්න දිනක රාත්‍රී හයයි පනස් පහ (ප.ව. 6.55 ) ප්‍රවෘත්ති විකාශය තුළින් ප්‍රචාරය කර ඇති බවද, එකී නාලිකාව ඔස්සේම විකාශනය වන උදෑසන "පත්තරේ විස්තරේ" වැඩසටහන මගින් ද සාකච්ඡාවට භාජනය කර ඇති බවට ද මා වෙත වැඩිදුරටත් උපදෙස් ලැබී ඇත.

ඔබ විසින් අදාළ මැතිවරණ වේදිකාවේදී හා අදාල යූ ටියුබ් චැනලය ඔස්සේ ප්‍රකාශ කර ඇති එම කරුණු සහ ඒ පිළිබඳව හිරු මාධ්‍ය ජාලයේ පළ වූ තොරතුරු මුළුමනින්ම අසත්‍ය බවටත් සහ/හෝ පදනම් විරහිත බවටත් සහ/හෝ සත්‍යයෙන් තොර බවටත් සහ/හෝ ද්වේශ සහගත බවටත් සහ/හෝ අගතිගාමී බවටත් සහ/හෝ අපහාසාත්මක බවටත් මා වෙත වැඩිදුරටත් උපදෙස් ලැබී ඇත.



Scanned with CamScanner